සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2017 ජනවාරි

## (AA15) ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය

(Business Operations and Management)

2017-01-29
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම, නායකත්වය සහ සන්නිවේදනය.

(2) සැලසුම් කිරීම, අරමුණු, අණදීමේ ඒකීයතාවය සහ සංවිධානමය ව්‍යුහය.

(3) සැලසුම් කිරීම, සංවිධානය කිරීම, නායකත්වය සහ පාලනය කිරීම.

(4) සැලසුම් කිරීම, අණදීමේ ඒකීයතාවය, නායකත්වය සහ සංවිධානමය ව්‍යුහය.

1.2 කෝවලස්වාමි ව්‍යාපාරයක් සමඟ සන්සන්දනය කිරීමේ දී හවුල් ව්‍යාපාරයක ඇති විශේෂ වාසිය වන්නේ:

(1) අවදානම බෙදීම.

(2) ක්ෂණික තීරණ ගැනීම.

(3) අසීමිත වගකීම.

(4) ගිණුම්කරණය අනිවාර්ය වීම.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන්නේ කුමක් ද?

(1) හැටන් නැෂනල් බැංකුව. (2) ලංකා බැංකුව.

(3) ජාතික ඉතිරි කිරීමේ බැංකුව. (4) මහජන බැංකුව.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, සීමාසහිත පොදු සමාගම් සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) අවම කොටස්කරුවන්ගේ සංඛ්‍යාව 01 කි.

(2) උපරිම කොටස්කරුවන්ගේ සංඛ්‍යාව 50 කි.

(3) අවම අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව 02 කි.

(4) වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත්කිරීම අනිවාර්ය වේ.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, පොටර්ගේ පංචබල විශ්ලේෂණයට (Porter's Five Forces) අයත් සංරචකයක් **නොවන්නේ** කුමක් ද?

(1) අලුතෙන් ඇතුළුවන්නන්ගෙන් ඇතිවන තර්ජන. (2) සැපයුම්කරුවන්ගේ කේවල් කිරීමේ හැකියාව.

(3) සේවකයන්ගේ කේවල් කිරීමේ හැකියාව. (4) ගැනුම්කරුවන්ගේ කේවල් කිරීමේ හැකියාව.

1.6 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, තොග කළමනාකරණය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) ගනුදෙනුකරුවන්ගේ ඉල්ලුම සැපිරීමට එය අවශ්‍ය වේ.

(2) පවත්වාගෙන යා යුතු සහ ඇනවුම් කළ යුතු තොග ප්‍රමාණයන් තීරණය කිරීමට එය උපකාරී වේ.

(3) තොගයෙහි පිරිවැය සඵලදායකත්වය සඳහා එය උපකාරී වේ.

(4) ඉහත සඳහන් සියල්ලම.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, නිෂ්පාදනය කරන ලද නිෂ්පාදිතයක ගුණත්වය මැනීමේ මානයක් (quality dimension) **නොවන්නේ** කුමක් ද?

(1) ලක්ෂණ. (2) නිරවද්‍යතාව. (3) විශ්වාසනීයත්වය. (4) කල්පැවැත්ම.

1.8 රාජකාරි ප්‍රමාණය හා විෂය පථය ඉහළ නංවමින් රැකියාවක් නිර්මාණය කිරීම හඳුන්වනු ලබන්නේ:

(1) රැකියා පුළුල් කිරීම (Job enlargement) ලෙස ය. (2) රැකියා භ්‍රමණය (Job rotation) ලෙස ය.

(3) රැකියා පෝෂණය (Job enrichment) ලෙස ය. (4) රැකියා පිරිවිතරය (Job specification) ලෙස ය.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, මානව සම්පත් සඳහා ඉල්ලුම පුරෝකථනය කිරීම සඳහා භාවිත කරන ශිල්ප ක්‍රමයක් වන්නේ කුමක් ද?

(1) ප්‍රතිසම්පාදන වගු. (2) මාණ්ඩලිකරණ වගු.

(3) උපනති විශ්ලේෂණය. (4) කුසලතා ඉන්වෙන්ට්‍රි (Skills inventories).

1.10 පහත සඳහන් පැතිකඩ අතුරෙන්, මානව සම්පත් කළමනාකරණයේ විෂය පථයට අයත් **නොවන්නේ** කුමක් ද?

(1) පුද්ගල පැතිකඩ. (2) සුභ සාධක පැතිකඩ.

(3) නිෂ්පාදන පැතිකඩ. (4) කාර්මික සම්බන්ධතා පැතිකඩ.

1.11 පහත සඳහන් ඒවා අතුරෙන්, "අලෙවිකරණ දර්ශනයට" (marketing philosophy) අදාල උපාය (tactic) කුමක් ද?

(1) සමෝධානිත (integrated) අලෙවිකරණ වැඩ සටහන්.

(2) ආක්‍රමණශීලි (aggressive) විකුණුම් සහ අලෙවි ප්‍රවර්ධන ප්‍රයත්නයන්.

(3) ඉහළ නිෂ්පාදනය තුළින් ඉහළ ලාභ.

(4) නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.

1.12 පොදු අවශ්‍යතා හෝ අලෙවිකරණ කටයුත්තකට එකලෙස ප්‍රතිචාර දැක්වීම පාදක කොටගෙන වෙළෙඳපොළ නිශ්චිත කොටස් වලට බෙදීම හඳුන්වනු ලබන්නේ:

(1) වෙළෙඳපොළ ඛණ්ඩනය ලෙස ය.

(2) ඉලක්ක අලෙවිකරණය ලෙස ය.

(3) වෙළෙඳපොළ ස්ථානගත කිරීම ලෙස ය.

(4) සීමිත වෙළෙඳපොළ අලෙවිකරණය (Niche Marketing) ලෙස ය.

1.13 පහත සඳහන් ඒවා අතුරෙන්, නිෂ්පාදිත අලෙවිකරණ මිශ්‍රය තෝරන්න:

(1) නිෂ්පාදිතය, මිල, ප්‍රවර්ධනය, මිනිසුන්. (2) නිෂ්පාදිතය, මිල, ප්‍රවර්ධනය, ස්ථානය.

(3) නිෂ්පාදිතය, මිල, ක්‍රියාවලිය, ස්ථානය. (4) නිෂ්පාදිතය, මිනිසුන්, ක්‍රියාවලිය, භෞතික සාක්ෂි.

1.14 පහත සඳහන් ඒවා අතුරෙන් ස්ථානගත කිරීමේ ප්‍රවේශයක් (positioning approach) / උපායමාර්ගයක් වන්නේ කුමක් ද?

(1) අගය (value) ස්ථානගත කිරීම ලෙසය. (2) නිෂ්පාදිත පංති ස්ථානගත කිරීම ලෙසය.

(3) භාවිතා කරන්නන් (user) ස්ථානගත කිරීම ලෙසය. (4) ඉහත සඳහන් සියල්ලම.

1.15 පහත සඳහන් ඒවා අතුරෙන්, සමාගමක කටයුතු බාහිර මූලාශ්‍රකරණය (outsourcing) කිරීම සඳහා හේතුවන සාධකයක් **නොවන්නේ** කුමක් ද?

(1) මෙහෙයුම් පිරිවැය අඩුකර ගැනීම. (2) සමාගම සතුව සම්පත් නොමැති වීම.

(3) ප්‍රධානතම ව්‍යාපාරයට අවධානය යොමු කිරීම. (4) වෙළෙඳපොළට පිවිසීමට ගතවන කාලය වැඩි වීම.

*අංක 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්න වල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය, ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.16 …………………… *(සංවිධානය කිරීම / සැලසුම් කිරීම)* යනු අරමුණු ස්ථාපිත කිරීම සහ එකී අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග තීරණය කිරීම ඇතුලත් කළමනාකරණ ශ්‍රිතයයි.

1.17 …………………… *[ආර්ථික ඇණවුම් ප්‍රමාණය / තත්කාලීන (Just in time) තොග]* යනු මුළු තොග පිරිවැය අවම කරන්නා වූ ප්‍රශස්ත ඇණවුම් ප්‍රමාණයයි.

1.18 …………………… *(මානව සම්පත් කළමනාකරණය / අලෙවිකරණය සහ විකුණුම්)* යනු පොටර්ගේ වටිනාකම් දාමය (Porter's Value Chain) මඟින් හඳුනාගෙන ඇති උපකාරක ක්‍රියාකාරකමකි.

1.19 පරිසරය හෝ සංවිධානය පිළිබඳව ඇති සකස් නොකළ කරුණු සහ සංඛ්‍යාංක හඳුන්වනු ලබන්නේ …………………… *(තොරතුරු / දත්ත)* ලෙසය.

1.20 …………………… (ප්‍රභේදනය වූ අලෙවිකරණය / ප්‍රභේදනය නොවූ අලෙවිකරණය) මඟින් වෙළෙඳපොළේ එක් නිශ්චිත කාණ්ඩයක් ඉලක්ක නොකරයි. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

හිමිකාරත්වය, අරමුණු, ප්‍රමාණය යනාදී සාධක සැලකිල්ලට ගෙන ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කළ හැකිය. කෙසේවෙතත්, ව්‍යාපාර සංවිධානයේ ස්වරූපය සැලකිල්ලට ගැනීමකින් තොරව, ඕනෑම ව්‍යාපාරික සංවිධානයකට තම මෙහෙයුම් කටයුතු කරගෙන යාම සඳහා උපකාරක සේවා ඉතා වැදගත් වේ. මූල්‍ය සේවා, ප්‍රවාහනය, සන්නිවේදනය, රක්ෂණය සහ ගබඩාකරණය යනාදිය ව්‍යාපාර සංවිධානයක මෙහෙයුම් කටයුතු පහසු කිරීමට උපකාරවන ප්‍රධාන උපකාරක සේවා වේ.

(a) හවුල් ව්‍යාපාරයක් සහ වගකීම සීමාසහිත පෞද්ගලික සමාගමක් අතර වෙනස්කම් හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) ව්‍යාපාර සංවිධානයක් සඳහා හොඳ ප්‍රවාහන පද්ධතියක වැදගත්කම **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

ව්‍යාපාර සංවිධානයක් හස්ත (manual) ක්‍රමයට ක්‍රියාත්මක කරන ලද තොරතුරු පද්ධතියක් තාක්ෂණික පද්ධතියකට පරිවර්තනය කර තිබේ. මෙම පරිවර්තනය නිසා සංවිධානයකට වාසි රැසක් අත්වී තිබේ. තොරතුරු පද්ධතිය දියුණු කිරීම සඳහා ගෝලීයකරණය ද දායක වී තිබේ.

(a) තොරතුරු කළමනාකරණය සඳහා තාක්ෂණික පද්ධතියක් භාවිත කිරීමේ වාසි පහක් (05) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 05)

(b) ව්‍යාපාර සංවිධානයකට විද්‍යුත් වාණිජ්‍යය උපකාර වන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

සංවිධානයක රැකියා ඇබෑර්තු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් පුද්ගල කණ්ඩායමක් සොයා ගැනීම සහ ආකර්ෂණය කරගැනීමේ ක්‍රියාවලිය බඳවාගැනීම (recruitment) යනුවෙන් හඳුන්වනු ලැබේ. විභව (potential) අයදුම්කරුවන් බඳවාගැනීම සහ තෝරාගැනීම සිදු කළ විට ඔවුන් සමාගමේ සේවකයන් බවට පත්වේ. සේවකයන් කාර්යයන් සඵලදායී ලෙස ඉටුකිරීම සඳහා ඔවුන්ව පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම සේවායෝජකයාගේ යුතුකම වේ.

(a) ක්‍රමානුකූල බඳවාගැනීමේ ක්‍රියාවලියකට සම්බන්ධ පියවර **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(b) සේවකයන් සඵලදායී ලෙස පුහුණු කිරීම තුළින් සංවිධානයකට ලබා ගත හැකි ප්‍රතිලාභ **විමසන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

### 05 වන ප්‍රශ්නය

අලෙවිකරණය යනු, පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සහ වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ සහ සේවා සැපයීමේ ක්‍රියාවලිය යි. අලෙවිකරණයේ දී සන්නාමකරණය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

(a) සන්නාමකරණයේ වාසි හතරක් (04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) අලෙවිකරණයේ පහත සඳහන් පද **පැහැදිලි කරන්න**:

- (i) නිෂ්පාදිත (Market offering / product).
- (ii) ඉලක්ක අලෙවිකරණය (Target Marketing). (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**මාරියෝ බිස්කට් සමාගම** 1970 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මෙහෙයුම් කටයුතු ස්ථාපනය කරන ලද ප්‍රමුඛ පෙළේ බිස්කට් නිෂ්පාදනය කරන සමාගමක් වන අතර, මේ වන විට දශක තුනකට වඩා වැඩි කාලයක් එහි කටයුතු සාර්ථකව සිදු කර තිබේ. පසුගිය වසර පහ තුළම බිස්කට් නිෂ්පාදනය කරන හොඳම සමාගම් පහ අතරට මෙම සමාගම ඇතුළත් වී තිබේ. මාස තුනකට පෙර **තෝමස්** මෙම සමාගමේ නව ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත්කර තිබේ.

විශේෂයෙන්ම කුඩා ළමුන් ප්‍රියකරන විවිධ රසයෙන් යුත් බිස්කට් නිෂ්පාදනය කරන සමාගමක් ලෙස **මාරියෝ බිස්කට් සමාගම** ඉතා ප්‍රසිද්ධය. සමාගමේ කර්මාන්තශාලාව පවත්වාගෙන යන ලද්දේ අත්දැකීම් බහුල මෙහෙයුම් කළමනාකරුවකු විසින් වන අතර, වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසු ඔහු දැනට මාස 6 කට පෙර සමාගමෙන් විශ්‍රාම ගොස් ඇත. වර්තමානයේදී, සේවකයන් 3,000ක් පමණ සේවා මුර ක්‍රමයට (shift basis) කර්මාන්තශාලාවේ සේවය කරයි.

පසුගිය මාස 6 ක කාලපරිච්ඡේදය තුළ දිනකට සැලකිය යුතු පැය ගණනක් නිෂ්පාදන යන්ත්‍ර භාවිතයට නොගන්නා බවත් පසුගිය මාස 6 ක කාලපරිච්ඡේදය තුළ නිෂ්පාදනය සහ අලෙවිය ද පහත වැටී ඇති බවත් **තෝමස්** නිරීක්ෂණය කර තිබේ. බොහොමයක් අංශවලින් ලැබුණු අයහපත් සංඥා හේතුවෙන් නව ප්‍රධාන විධායක නිලධාරීවරයා වෙළෙඳපොළ සමීක්ෂණයක් පැවැත්වීමට තීරණය කරන ලද අතර, එමගින් පහත දැක්වෙන කරුණු අනාවරණය වී ඇත.

- කුඩා ළමුන් සඳහා සමාන රසයන්ගෙන් යුත් බිස්කට් නිෂ්පාදනය කරන නව තරඟකාරී ආයතනයක් වෙළෙඳපොළට පිවිස තිබීම.
- පසුගිය වර්ෂ 5 පුරාම අලෙවිය ක්‍රමානුකූලව පහත වැටී තිබීම.
- පසුගිය වසර 5ක කාලය තුළ සමාගමේ වෙළෙඳපොළ කොටස 22% සිට 18% දක්වා අඩු වීම.
- බදු හේතුවෙන් නිෂ්පාදිතවල මිල ගණන් ඉතා විශාල ලෙස ඉහළ ගොස් තිබීම.
- ඉහත හේතු නිසා එම කාලපරිච්ඡේදය තුළ සමාගමේ ලාභ ආන්තිකය (profit margin) ද ඉතා විශාල ලෙස පහත වැටී තිබීම.

පසුගිය සිකුරාදා දින සේවක සංගමය විසින් නව ප්‍රධාන විධායක නිලධාරී සමඟ සාකච්ඡාවක් පවත්වා ඔවුන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කරන ලදී. අඩු වැටුප් සහ අනෙකුත් දීරි දීමනා, උසස් වීම්, කාර්යඵල ඇගයීම් සහ ප්‍රතිලාභ යනාදිය නොමැති වීම හේතුවෙන් අතෘප්තියට පත් සේවකයින් බොහොමයක් සමාගමේ රැකියාවලින් ඉවත්ව යාමට පටන්ගෙන ඇති බව සේවක සංගමය එහි දී අවධාරණය කර තිබේ.

මෙම ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා ප්‍රධාන විධායක නිලධාරියා විසින් සමාගමට මෙහෙයුම් කළමනාකරුවකු වහාම බඳවා ගන්නා ලදී. තවද සඵලදායී කාර්යඵල ඇගයීමේ ක්‍රමයක් නිර්මාණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ඔහු මෙහෙයුම් කළමනාකරුට උපදෙස් දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශදුඅත (SWOT) විශ්ලේෂණ ක්‍රමය භාවිත කරමින් **මාරියෝ බිස්කට් සමාගමේ** මෙහෙයුම් කෙරෙහි පරිසරයේ බලපෑම **තක්සේරු කරන්න**. (ලකුණු 08)

(b) මෙම සමාගමට අදාළව මෙහෙයුම් කළමනාකරුගේ කාර්යභාරය **හඳුනා දක්වන්න**. (ලකුණු 08)

(c) සඵලදායී කාර්යඵල ඇගයීමේ පද්ධතියක ගුණාංග හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |